# මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සදහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනවල **තනතුරෙහි ස්ථිර කරන ලද සේවකයින්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරි/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් **2019.04.09 වෙනි දින හෝ ඊට පෙර ලැබෙනසේ ලේඛනගත තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරි/ ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය.**

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි එය සලකා බලනු නොලැබේ.

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 692 විධිවිධාන අනුව වෘත්තීය/යෝග්‍යතා/ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවාගනු ලැබේ.

## 01. විනයාරක්ෂක නිලධාරි - II ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම් (I) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම

(II) වයස :අවුරුදු 30 -45 අතර විය යුතුය.

(III) ශාරීරික සුදුසුකම් : පිරිමි - උස-අඩි 5 අගල් 5ට නොඅඩු විය යුතුය. කාන්තා උස-අඩි 5 අගල් 4ට නොඅඩු විය යුතුය.පපුව -අගල් 32 (සාමාන්‍ය)

**සටහන :** පොලිස්/සන්නද්ධ හමුදා සේවා පසුබිමක් ඇති සහ විශ්වවිද්‍යාල හා ජාතික මට්ටමේ ක්‍රීඩා කටයුතු හා සමාජ සුභසාධන කටයුතු වලදී ක්‍රියාකාරී ලෙස සහභාගී වී ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

හෝ

සන්නද්ධ හමුදා සේවයේ මේජර් තනතුරට නොඅඩු තනතුරක හෝ ශ්‍රී ලංකා පොලිසියේ ඒ හා සමාන වූ තනතුරකට නොඅඩු තනතුරක සේවා පලපුරුද්ද.

වැටුප් ක්‍රමය :රු.42885-18x660-54,765/-(මාසික) U-MN3 (II) (17/2016 (v) චක්‍රලේඛයේ 2020 වර්ෂයට අදාලව

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.

## 02. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (පොත් තබන්නා)

අවශ්‍ය සුදුසුකම් (1) අ.පො.ස (සා.පෙළ) විභාගය පහත සඳහන් විෂයයන් වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් එකවර සමත් වී තිබීම.

(i) සිංහල භාෂාව/දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය
(iii) ගණිතය

සහ

(2) අ.පො.ස (උසස් පෙළ) විභාගයේ සියළු විෂයන් එකවර සමත් වීම (පොදු පරීක්ෂණය හැර)

<u>සටහන -</u> පහතින් දක්වා ඇති සුදුසුකම්ලත් අයවළුන් සඳහා වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජය භාවිතය පිළිබඳව වසර 02 ක පළපුරුද්ද

<u>තනතුරට විශේෂවු සුදුසුකම් -</u>

ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව සීමිත හා විවෘත කාණ්ඩ යටතේ වන අයදුම්කරුවන් පහතින් දක්වා ඇති තනතුරට විශේෂ වු සුදුසුකම් සපුරාලිය යුතුය.

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කාර්මික විද්‍යාල/තාක්ෂණික විද්‍යාල හෝ පිළිගත් ආයතනයකින් ගිණුම්කරණ තාක්ෂණවේදය පිළිබඳ ජාතික මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

හෝ

(ආ) අ.පො.ස. (උසස් පෙළ) වාණිජ්‍ය විෂය ධාරාවෙන් හදරා තිබීම.

වැටුප් ක්‍රමය රු. 30,725-17x300-35,825 (මාසිකව) U-MN I(IIIA) 17/2016(v) චක්‍රලේඛයේ 2020 වර්ෂයට අදාලව

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.

03. <u>විදුලි කාර්මික 11 ශ්‍රේණිය</u>

අවශ්‍ය සුදුසුකම් (I) කියවීමට හා ලිවීමට හැකියාව

(II) පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම

(අ) දෝෂයන් සොයා ගැනීම, ද්‍රව්‍ය අළුත්වැඩියා කිරීම සහ නැවත සවි කිරීම, ට්‍රාන්ස්ෆෝමර් සහ සියළුම වර්ගවල යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කේබල්, වයර් කම්බි සහ ඒවා වර්ග කිරීම, මිනුම් උපකරණ හා ඒවායේ භාවිතය, වයර් කම්බි ඇදීමේ විවිධ ක්‍රම, බද්ධ කිරීම, මීටර් හා කුඩා ට්‍රාන්ස්ෆෝමර් පරීක්ෂා කිරීම.

(ආ) ඇඳීමේ සහ රූප සටහන් කියවා තේරුම් ගැනීම, පරිමාණයන් කියවීම සහ භාග වලින් මාන සටහන් තැබීම.

(ඇ) මෙම කාර්යයන්හිදී භාවිතා කරනු ලබන ආවුදවල ආරක්ෂාව සහ ඒවා පාවිච්චි කිරීම පිළිබඳ දැනුම තිබිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක විදුලි කාර්මිකයෙකු වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : රු.27,062-16x244-30,966/-(මාසික) U-PL3 (III) (2019 වර්ෂයට අදල වේ)
රු.29,915-16x270-34,235/-(මාසික) (2020 වර්ෂයට අදල වේ)

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනුලැබේ.

04. **<u>පින්තාරුකරු 11 ශ්‍රේණිය</u>**

අවශ්‍ය සුදුසුකම් (I) කියවීමට හා ලිවීමට හැකියාවක් තිබීම

(II) පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම

(අ) ගොඩනැගිලි ඉදි කිරීමේදී හා නඩත්තු කිරීමේදී කරනු ලබන පින්තාරු වැඩ

(ආ) සියළුම සුප්‍රසිද්ධ සහ සාමාන්‍ය හිමිකම් සහිත පින්තාරු වර්ග, සියළුම වර්ගවල ද්‍රව්‍ය, විවිධාකාර මතුපිටවල් පිළියෙල කර ගැනීම සහ ඉතාම නිවැරදි නිමාවට එනතෙක් තොරාගත් ද්‍රව්‍ය සියළුම පියවරවලදී නිවැරදි ලෙස යොදා ගැනීම

(ඇ) විවිධ අන්දමේ මිශ්‍රණයන් සහ පින්තාරු ද්‍රව්‍ය නියමිත පරිදි ගබඩා කර තැබීම.

(ඈ) උපකරණ පාවිච්චිය සහ ඒවායේ පිරිමැස්ම සහිත නඩත්තුව යන කරුණු පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

(III) රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක පින්තාරු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබාතිබීම.

වැටුප් ක්‍රමය : රු.25,354-16x244-29,258/-(මාසික) UPL 2(III) (2019 වර්ෂයට අදාල වේ)
රු.28,025-16x270-32345/-(මාසික) (2020 වර්ෂයට අදාල වේ)

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනුලැබේ.

ලේඛකාධිකාරි,

මොරටුව විශ්වවිද්‍යාලය,

මොරටුව.

2019.03.18